**පලාගල ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පලාගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් රු.4,208,656 ක් ගිණුම්ගත කර තිබූ නමුත් එයට අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කර නොතිබීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන රු.4,208,656 කින් අඩුවී තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බේකරි ද්‍රව්‍ය ඉතිරි තොග රු.119,838 ක් බේකරි අමුද්‍රව්‍ය විකුණුම් ගිණුම හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම එම වටිනාකමෙන් වැඩි වී තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ජල බෝතල් විකුණුම් පිරිවැය රු.97,724 ක්, ලිපිද්‍රව්‍ය වියදම් රු.12,600 ක් හා විදුලි තොග වියදම් රු.4,448 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර නොතිබීම නිසා විස්තීර්ණ ආදායම එම වටිනාකම්වලින් අඩුවී තිබුණි. | නිමි බෝතල් සහ හිස් බෝතල් වටිනාකම එකට ගෙන ගිණුම්ගත කිරීම නිසා මෙම දෝෂය සිදුවී ඇති බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී කොන්ක්‍රීට් ද්‍රව්‍ය විකුණුම් වියදම් රු.63,325 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා කොන්ක්‍රීට් නිෂ්පාදන වෙළඳ හා ලාභාලාභ ගිණුමේ ගිණුම්ගත කර නොතිබීම නිසා විස්තීර්ණ ආදායම එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | පිළිගන්නා බව. | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයිතම 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනය හා ලෙජරය අනුව වටිනාකම රු.11,893,503 ක් වුවත් උපලේඛන අනුව වටිනාකම රු.11,234,111 ක් වූයෙන් රු.659,392 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | අයිතම 3 කට අදාළව සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වටිනාකම රු.17,994,249 ක් වුවත් සටහන් අනුව එම වටිනාකම රු.18,549,872 ක් වූයෙන් රු.555,623 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පානීය ජල බෝතල් හා ජල ව්‍යාපෘතියේ ඒකාබද්ධ නිෂ්පාදන හා ලාභාලාභ ගිණුමේ හඳුනාගත් ආයතන පරිපාලන හා විකිණීමේ වියදම් රු.425,928 ක් පිළිබඳ විස්තර ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒ පිළිබඳව සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | වියදම් වෙන වෙනම හඳුනාගත හැකි වන පරිදි ලේඛන නඩත්තු කර නොමැති බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.2,825,621 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.6,674,235 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ලැබී තිබූ මුද්දර ගාස්තු රු.2,259,150 ක් හා උසාවි දඩ රු.6,890,513 ක් ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල නොයොදවා අනියම් සේවකයන්ගේ වැටුප ගෙවීම සඳහා යොදවා ගෙන තිබුණි. | පිළිගන්නා බව. | මෙම මුදල් ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලට යෙදවිය යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,582,470 | 1,772,920 | 1,743,040 | 29,880 | 1,559,450 | 1,632,460 | 1,648,660 | - |
| (ii) | කුලී | 2,553,893 | 2,915,370 | 2,379,300 | 1,926,870 | 2,064,960 | 2,137,903 | 2,257,953 | 1,390,800 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 271,220 | 293,890 | 293,890 | - | 306,995 | 267,175 | 268,175 | - |
| (iv) | වෙනත් ආදායම් | 39,463,360 | 15,997,115 | 11,211,463 | 12,921,891 | 34,132,300 | 13,605,759 | 10,308,586 | 8,136,239 |
| | | 43,870,943 | 20,979,295 | 15,627,693 | 14,878,641 | 38,063,705 | 17,643,297 | 14,483,374 | 9,527,039 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| (i) | 2019 – 2023 දක්වා වර්ෂවල මස්කඩ බදුදීම වෙනුවෙන් අයවිය යුතු කුලී රු.1,869,450 ක් අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේදී සභාවට අයත් වාහන කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.755,100 ක් 2023 වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ආ) | **වෙනත් ආදායම්** | | |
| (i) | 2021, 2022 වර්ෂවලට අදාළව විවිධ සැපයුම් වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.688,768 ක් 2023 වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලයට යොමුකර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,887,387 ක් හා මුද්දර ගාස්තු රු.525,000 ක් විය. | 2022, 2023 වර්ෂවල මුද්දර ගාස්තු තොරතුරු ඉල්ලා ලිපි යොමුකර ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පළාත් සභාව විසින් පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව වැලඳගෙන ඇති බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිනින්දෝරු සැලසුම් සහ වීථි රේඛා අනුමත කිරීම් සිදු කර ගැනීමකින් තොරව ඉදිකිරීම් සිදුකර තිබුණු අතර ඒ සම්බන්ධව රාජකාරී කිරීම සඳහා නිලධාරියෙක් ද සභාව විසින් පත්කර නොතිබුණි. | පිළිගන්නා බව. | නිලධාරියෙකු පත්කර අදාළ කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ආ) | පුබ්බෝගම පුස්තකාලයට යාබදව පිහිටි සාරවත් පොල් වගාවකින් යුතු අක්කර 02 ක ඉඩම බදුදීමට හෝ සභාවේ සේවකයන් යොදවා නඩත්තු කර ආදායම් ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර එම ඉඩමේ වැට හා ගේට්ටු සකස් කර නොතිබීම නිසා නගරයේ පුද්ගලයන් කැලි කසළ එම ඉඩමට බැහැර කරමින් පැවතුණි. | -එම- | ආදායම් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු අතර ඉඩමේ ආරක්ෂාව තහවුරු කරගත යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | LDSP ව්‍යාපෘතිය යටතේ වූ අරමුදල් වලින් රු.9,236,000 ක් වියදම් කර මිලදීගත් වත්කම් 2023 වර්ෂයේදී නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැති බව. | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී හිඟුරුවැව ප්‍රදේශයේ රු.19,741,026 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල සහ ළිඳ නිෂ්කාර්යව පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) | ජල බෝතල් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට 2022 ජුලි මාසයේදී මිලදීගත් ජල ටැංකි, ජල ටැංකි රඳවන කුළුණු, ඉදිකළ නල ළිඳ, සහ වටිනාකම රු.2,676,082 ක් වූ ජල බෝතල් හා වටිනාකම රු.88,233 ක් වූ ලේබල් තොගයක් නිෂ්කාර්යව පැවතුණි. | -එම- | -එම- |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ත්‍රී රෝද රථ 02 ක් ද, අත්ට්‍රැක්ටරය ක් ද අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර ගාල්කර තිබුණි. | පිළිගන්නා බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | භාවිතයෙන් ඉවත්කර වසර 01 සිට වසර 05 කට අධික කාලයක් ගතවී තිබුණු වාහන 02 ක් අපහරණය කිරීමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම එක් වාහනයක් නැවත ප්‍රධාන ලේකම් වෙත භාරදීමටත් අනෙක් රථයේ අයිතිය සභාව වෙත පවරාගෙන අපහරණය කිරීමටත් කටයුතු කරන බව. | අපහරණය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික ආයතනයක් මගින් ඉදිරිපත් කළ පොල් තෙල් සිඳින යන්ත්‍රය රු.375,000 කට මිලදී ගැනීමට සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණු නමුත් එම යන්ත්‍රය ක්ෂේත්‍රයේ විරල බවට සඳහන් කර ප්‍රසම්පාදන කමිටුව වෙනත් ආයතනයකින් මිලදි ගැනීමට තීරණය කිරීම නිසා රු.141,000 ක වැඩිපුර ගෙවීමක් සිදුවී තිබුණි. | අමතර කොටස් සහ සේවාවන් පහසුව සලකා ප්‍රසම්පාදන කමිටුව එම තීරණය ගෙන ඇති බව. | මිලදී ගැනීමේදී තාක්ෂණ කමිටු නිර්දේශය සහ පිරිවැය අවම වීම යන කාරණා සම්බන්ධයෙන් අවධානය යොමුකර තීරණ ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් ඉටු කර නොතිබුණු අතර එම කාර්යයන් සඳහා වියදම් ඇස්තමේන්තු ද ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂය තුළදී ඉටුකිරීමට බලාපොරොත්තු වන බව. | සැලසුම් කළ ව්‍යාපෘති අදාළ වර්ෂය තුළදී ඉටුකළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂය සඳහා වූ අයවැය අනුව බල ප්‍රදේශයේ උපයෝගිතා සංවර්ධනය සඳහා රු.1,500,000 ක් වෙන්කර තිබුණු නමුත් එම කාර්යයන් සිදුකර නොතිබුණි. | -එම- | සැලසුම් කළ ව්‍යාපෘතියට අදාළ වර්ෂය තුළදී ඉටුකළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීමෙන් 2023 වර්ෂයේදී ද සභාව බැහැර වී කටයුතු කර තිබුණි. | කසළ බැහැර කිරීම සඳහා ඉඩමක් නොමැති වීම නිසා කසළ එකතු කිරීම සිදුකර නොමැති බව. | විධිමත් ලෙස කසළ බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |